# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
# குடிவரவு மற்றும் குடியகல்வுத் திணைக்களம்
# DEPARTMENT OF IMMIGRATION & EMIGRATION

"සුහුරුපාය" ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சுஹுருபாயா", ஸ்ரீ சுபூத்திபுர வீதி, பத்தரமுல்லை, இலங்கை.
"Suhurupaya", Sri Subhuthipura Road, Battaramulla, Sri Lanka.
E-mail: controller@immigration.gov.lk


SRI LANKA
IMMIGRATION AND EMIGRATION

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. : DIE/E02/1/2019/Vol. II | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2023.06. ...... |

ලියාපදිංචි තැපෑලෙනි

.............................................................................. මහතා /මහත්මිය / මෙනෙවිය
..............................................................................
..............................................................................
..............................................................................

**<u>ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය 2023.06.12</u>**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත / කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරී තනතුරේ II ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,193 හා 2020.09.11 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධියට පත් කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනය ප්‍රකාරව අයදුම්පත් කැඳවා, 2022.02.27 දින ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද විවෘත තරඟ විභාගයෙන් ඔබ සමත් වී ඇති බැවින් බලයලත් නිලධාරී තනතුරට බඳවා ගැනීමට සලකා බැලීම සඳහා 2023.06.12 දින පෙ.ව. 9.00ට ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේදී පැවැත්වෙන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන මෙන් ඔබට දන්වමි.

02. (අ) ඒ අනුව නියමිත දිනදී අදාළ වේලාවට සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන ලෙස ඔබ වෙත දන්වන අතර ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් හා සහතික කරන ලද ඡායා පිටපත් ගොනු 02ක් ලෙස සකසා රැගෙන එන ලෙස ද දන්වමි.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත/ වලංගු විදේශ ගමන් බලපත්‍රය / වලංගු රියදුරු බලපත්‍රය

II. අධ්‍යාපන සහතිකපත්‍ර

එනම්,

- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති විශ්වවිද්‍යාලයක් හෝ උපාධි ප්‍රදානය කෙරෙන ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත් උපාධියක් තිබීම.

සහ

- අ.පො. ස. සාමාන්‍ය පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

යන සුදුසුකම් සනාථ කිරීමට අදාළ වන සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

<u>*සැ.යු:*</u>

(උපාධිය බලපවත්වන දිනය සහ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉහත සාමාර්ථයන් ලැබූ දිනයන් සුදුසුකම් සපුරාලිය යුතු අවසාන දිනය වන 2020 ඔක්තෝබර් 16 වන දින හෝ ඊට පෙර දිනයක් විය යුතුය.)

III. චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුය

IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් දිනට එනම් 2020 ඔක්තෝබර් 16 දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.


දුරකථන / தொலைபேசி / Telephone

| | | |
|---|---|---|
| ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline: 1962 | පොදු / பொது / General: (+94) 11-5329000 | ෆැක්ස් / பக்ஸ் / Fax: (+94) 11-2885358 |

(ආ) ඉහත 2 (අ) හි සඳහන් ගොනු මතු සඳහන් පරිදි සකස් කළ යුතුය.

පළමු ගොනුව : ඉහත I, II හා III හි සුදුසුකම් සනාථ කිරීමට අදාළ වන සහතිකවල මුල් පිටපත්

දෙවන ගොනුව : ඉහත I, II හා III හි සුදුසුකම් සනාථ කිරීමට අදාළ වන සහතිකවල සහතික කළ පිටපත් (විධිමත් බලධාරියකු විසින් සත්‍ය පිටපත් බවට සහතික කර තිබිය යුතුය.) මෙම සෑම සහතික කළ පිටපතකම ***"මෙම සහතිකපත්‍ර පිටපත මුල් පිටපත හා සසැඳෙන අතර බඳවා ගැනීමේ නිවේදනයේ අපේක්ෂිත සුදුසුකම්වලට මෙම සහතිකය අනුකූල වන බව සහතික කරමි"*** යනුවෙන් සටහන් කර අයදුම්කරු විසින් ද ස්වකීය අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

03. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේද යන්න පරීක්ෂා කිරීම සඳහා පැවැත්වෙන අතර මේ සඳහා ලකුණු ලබා දෙනු නොලබන බව ද සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීමක් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් ලෙස සලකනු නොලබන බව ද එමෙන්ම පුරප්පාඩු සංඛ්‍යාව අනුව සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් / අයදුම්කාරියන් ලිඛිත විභාගයේදී ලබා ගත් ලකුණු සංඛ්‍යාව මත ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ සිට කුසලතා අනුපිළිවෙලින් මෙම තනතුරට බඳවා ගනු ලබන බව ද දන්වමි.

04. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ඔබගේ කායික සුදුසුකම් සලකා බැලීම සිදු වන අතර ඒ අනුව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 6.3. හි සඳහන් කායික සුදුසුකම් ඔබ විසින් සපුරා තිබීම මෙහිදී අත්‍යාවශ්‍ය වේ.

05. ඔබ විසින් මෙම විභාගය සඳහා අයදුම් කිරීමේදී, විභාගය සඳහා පෙනී සිටීමේදී හෝ සම්මුඛ පරීක්ෂණයේදී සාවද්‍ය තොරතුරු සපයන ලද බවට අනාවරණය වන කවර අවස්ථාවකදී වුව ද (සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීමේ අවස්ථාව හෝ පත්වීම සඳහා සුදුසුකම් සපුරා තිබුණද එම පත්වීම ප්‍රදානය කිරීම හෝ පත්වීම් භාර ගැනීමෙන් පසුව හෝ) පත්වීම අවලංගු කෙරෙනු ඇත.

06. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම සඳහා ඔබට ගමන් වියදම් ගෙවනු නොලැබේ.

**සී. ජේ. රාජකරුණා**

පාලක (පාලන)

ආගමන හා විගමන පාලක ජනරාල් වෙනුවට

දුරකථන / தொலைபேசி / Telephone

ක්ෂණික ඇමතුම් / உடன் அழைப்பு / Hotline — 1962

පොදු / பொது / General — (+94) 11-5329000

ෆැක්ස් / பக்ஸ் / Fax — (+94) 11-2885358